# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2011 අංක 48 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 නොවැම්බර් මස 24 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 නොවැම්බර් මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 3.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2011 අංක 48 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 නොවැම්බර් මස 24 වන දින]

එල්.ඩී.—ඕ. 22/2010.

## ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2011 අංක 48 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (117 වන අධිකාරය වූ ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 117 වන අධිකාරියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "(1) ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන, (අන්තිම කැමති පත්‍රයක් හැර) සෑම සාධන පත්‍රයකම, එම සාධන පත්‍රයේ හෝ එයට යාකොට ඇති උපලේඛනයක එම සාධන පත්‍රය මගින් බලපෑමට ලක්වන ඉඩමෙහි හෝ නිශ්චල දේපළෙහි මායිම්, බිම් ප්‍රමාණය සහ පිහිටීම, එම ඉඩම හෝ නිශ්චල දේපළ පිහිටා ඇති දිස්ත්‍රික්කය, පත්තුව, කෝරළය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, පළාත් පාලන ආයතන බලප්‍රදේශය, ග්‍රාම නිලධාරී කොට්ඨාශය සහ ගමෙහි පැහැදිලි සහ නිවැරදි විස්තරයක් ද, එම ඉඩම හෝ නිශ්චල දේපළ පිහිටියේ පිළිවෙලින් (252 වන අධිකාරය වූ) මහ නගර සහා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ, (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහනගර සභා ප්‍රදේශයක්, නගරයක් හෝ සංවර්ධන ප්‍රදේශයක නම්, එහි වරිපනම් අංකය සහ වීථියේ නමක් ඇත්නම් එය ද, ඇතුළත් විය යුතු ය."

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—PL 006246—3,340 (2011/09)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.